කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන - 2020

---

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යාන්තර අරමුදල (IFAD) අතර 2017 ජුනි 26 දින එළඹි අංක 2000001843 දරන ණය ගිවිසුමෙ 9.03 වගන්තිය, 2017 නොවැම්බර් 21 දින එළඹි අංක 2000001984 දරන හා 2019 මැයි 16 දින එළඹි අංක 2000002639 දරන අතිරේක ණය මුදල් සඳහා වූ ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.

ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන්ගේ දරිද්‍රතාවය අවම කිරිම සහ තරඟකාරීත්වය සඳහා දායකවීම සහ වාණිජමය වශයෙන් නැඹුරු නිෂ්පාදන හා අලෙවිකරණ පද්ධතිවල නියැලී සිටින කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන් 57,000 දෙනෙකුගේ ආදායම සහ ආහාර වල ගුණාත්මකභාවය තිරසාරව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. වාණිජ හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය, ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය සහ ව්‍යාපෘති කළමනාකරණය හා ප්‍රතිපත්තිමය සාකච්ඡා යන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 17,170 කට සමාන වූ එජඩො මිලියන 105.03 වන අතර ඉන් රු. මිලියන 8,892 කට සමාන වූ එජඩො මිලියන 54.4 ක් සැපයීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යාන්තර අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 8,278 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරිමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2017 ජුනි 26 දින ආරම්භ කරන ලද අතර, 2023 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ විස්තර කර ඇති 02 ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හැර 2020 දෙසැම්බර් 31 දිනට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රතිලාභීන්ගේ දායකත්වය ගණනය කිරීම සඳහා නිවැරදි වාර්තාකරණ ක්‍රමයක් ව්‍යාපෘතිය විසින් අනුගමනය කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ප්‍රතිලාභීන්ගේ දායකත්වය විගණනයේදී සෑහීමකට පත්විය හැකි ලෙස පරීක්ෂා කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය. | 73.7 | අනුගමනය කරන ක්‍රමවේදයන් IFAD ට අනුකූල වන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහාවූ අත්පොතෙහි සඳහන්කර ඇත. | ව්‍යාපෘතිය විසින් ප්‍රතිලාභීන්ගේ දායකත්වය ගණනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුනාගත යුතු අතර මූල්‍ය ප්‍රකාශන තුළ පැහැදිලිව සඳහන් කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ ආරම්භයේ සිට ව්‍යාපෘතිය විසින් භාවිතා කරනු ලබන මෝටර් රථ තුනකට අදාළ වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළට ගෙන නොතිබුණි. | නැත | මෙම වාහන දෙකට අදාළ අයිතිය 2020 මැයි 29 වන දින ව්‍යාපෘතියට පවරාගත් අතර එහි වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරුකරන දෙපාර්තමේන්තුවට ඉල්ලීම්කර ඇත. තක්සේරු කිරීම් ලැබුණු පසු ගිණුම්පොත් තුළ වාර්තා කිරීමට කටයුතු කරමි. | අයිතිය පවරා ගැනීමෙන් පසු මෙම වාහන වල වටිනාකම් ගිණුම් වලට ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන ජංගම නොවන වත්කම් අගය කිරීම සඳහා ප්‍රමිතිගත අගය කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කිරීමකින් තොරව විවිධ ක්‍රම යටතේ වත්කම් අගයකර තිබුණි. | 72.7 | ව්‍යාපෘතියට අදාළ සියලුම වත්කම් තක්සේරුකරන දෙපාර්තමේන්තුව මගින් අගය කොට ගිණුම්පොත් වල වාර්තා කිරීමට කටයුතු කරමි. | ජංගම නොවන වත්කම් වලට අදාළ සත්‍ය අගය එකම අගය කිරීමේ ක්‍රමයක් භාවිත කරමින් සිදුකළයුතු අතර මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 756 | සෑම මුදල් වර්ෂයක් සඳහාම භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් එවැනි භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොමැත. | ඉදිරි මාසයන් තුළදී භාණ්ඩ සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු යොදා ඇත. | සෑම මුදල් වර්ෂයක් සඳහාම භාණ්ඩ සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රතිලාභීන් 2,1823 දෙදෙනෙකු සඳහා ප්‍රතිලාභ සැපයීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් 4P ගිවිසුම් 25 කට 2020 වර්ෂය අවසන්වන විට එළඹ ඇති අතර ඒ සඳහා රු.මිලියන 1,778 ක් වෙන්කර ඇත. කෙසේ වෙතත් රු.මිලියන 340ක් පමණක් භාවිතාකරමින් ව්‍යාපෘතිය විසින් ප්‍රතිලාභ සපයා ඇත්තේ ප්‍රතිලාභීන් 13,871 කට වන එය අපේක්ෂිත ප්‍රතිලාභීන්ගෙන් 63% ක් හා ප්‍රතිපාදනයෙන් 19% කි. | බොහොමයක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මධ්‍යම අදියරේ වන අතර ඇතැම් ඒවා සම්පූර්ණ කර ඇත. මේවන විට 77% ගොවීන් ප්‍රමාණයක් භෞතිකව එකතු වී ඇති අතර ඉන් 64% ක් සඳහා ප්‍රතිපාදනයන් ලබාදී ඇත. තවද ගිවිසුම්ගත ප්‍රදාන වටිනාකමෙන් 27% ක ප්‍රමාණයක් ගිවිසුම්ගත ගොවීන්ගෙන් 49% ක් සඳහා ලබාදී ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය යන දෙකම සමගාමීව අත්කරගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රජයේ අරමුදලින් රු.මිලියන 74ක ප්‍රමාණයක් සංරචක 02- "ග්‍රාමීය මූල්‍ය සඳහා ප්‍රවේශය" යටතේ ණය වශයෙන් ලබාදීමට වෙන්කර තිබුණි. මෙම සංරචකයේ අරමුණ වන්නේ දැරියහැකි අනුපාතයන් යටතේ ග්‍රාමීය මූල්‍ය සේවාවන්ට ප්‍රවේශය වීමට ප්‍රතිලාභීන්ට පහසුකම් සැපයීමවේ. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේදී ණය වෙනුවෙන් කිසිඳු මුදලක් භාවිතාකර නොමැත. | ව්‍යාපෘතිය විසින් IFAD අරමුදලෙන් වෙන් වූ ණය ප්‍රමාණය 2020 වර්ෂයේදී ලබාදී අවසන් කිරීමට සැලසුම් කල අතර සුළු ප්‍රමාණයක් (රු.මිලියන 73.9) RF තුළින් ඉල්ලීම් කරන ලදී. නමුත් වෙන්කරගත් මුදල කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර කාර්යයන්හි සීමාවීම් හා ඉල්ලීම් සැපයීම සඳහා බැංකු කාර්ය මණ්ඩලය හිඟවීම නිසා භාවිතා කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් 2021 වර්ෂයේදී RF යටතේ ගොවීන් ලියාපදිංචි වෙමින් ඇති අතර මේවන විට රු.මිලියන 284 ක ප්‍රමාණයක්ශ්‍රී ලංකා මහ බැංකුවට නැවත ආයෝජනය සඳහා නිකුත්කර ඇත. | ව්‍යාපෘති කටයුතු නිසි ලෙස නියාමනය කිරීම හා වේගවත් කළ යුතුය. |

3.2 මතභේදාත්මක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘති කාර්යාලය රාජගිරිය කුලී ගොඩනැගිල්ලේ සිට වෙනත් කුලී ගොඩනැගිල්ලකට 2020 මැයි 22 වන දින මාරු කරන ලදී. පරණ ගොඩනැගිල්ලේ ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් නැවත අයකරගත හැකි රු.මිලියන 3.2 ක මුදල සමාගමට ලියා හැරීමට සිදුවිය. එමෙන්ම නව ස්ථානයකට කාර්යාලය ගෙනයාම හේතුවෙන් කාර්යාල ගොඩනැගිල්ලේ තවදුරටත් අවශ්‍ය නොවන රු.මිලියන 6.8 ක සවිකිරීම් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබාදෙන ලදී. ව්‍යාපෘතිය මත මෙහි බලපෑම ව්‍යාපෘති අරමුණු වලට පටහැනි වේ. | ව්‍යාපෘති කළමනාකරණය රේඛීය අමාත්‍යාංශය මගින් ලබාදෙන නියෝග පිළිපැදිය යුතුය. කෙසේ වෙතත් මාරුවන අවස්ථාවේදී ව්‍යාපෘතිය විසින් සියලු සෞඛ්‍ය රීතීන් අනුගමනය කර ඇත. 2019 වර්ෂයේ විගණන වාර්තාවේ පැහැදිළි කර ඇති ආකාරයට මෙම තීරණය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මගපෙන්වීමේ නියෝජිත ආයතනයේ උපදෙස් අනුව ගෙන ඇත. එමෙන්ම රජයට සිදුවන පාඩුව අවම කර ඇත. | ව්‍යාපෘති යට හානි සහ පාඩු සිදු නොවන ලෙස තීරණ ගත යුතුය. |